"ඉන්දියානු හමුදාව ඉවත් වී යා යුතුයයි කීම මගේ තනි තීරණයක් නොවේ. එය අපේ ජනතාවගෙන් 95% කගේ නියමයක්"

— ජනාධිපති ශ්‍රීමත් ආර්. ප්‍රේමදාස මැතිතුමා



"IN ASKING FOR THE WITHDRAWAL OF INDIAN TROOPS FROM SRI LANKA I AM ONLY IMPLEMENTING A MANDATE GIVEN BY 95 PERCENT OF THE PEOPLE".

— PRESIDENT R. PREMADASA

BKT 0197
26/08/2023



**1989.07.22 දින පැවැති මැද කොළඹ එක්සත් ජාතික පක්ෂ විධායක මණ්ඩල රැස්වීම අමතා ජනාධිපති ශ්‍රීමත් ආර්. ප්‍රේමදාස මැතිතුමා විසින් ඉන්දියානු හමුදාව ශ්‍රී ලංකාවෙන් පිටමං කිරීම සඳහා ශ්‍රී ලංකා රජය ගෙන ඇති පියවර පිළිබඳව කළ කථාව**

අපේ මැතිවරණ ප්‍රකාශනයේ සඳහන් වී තිබෙනවා ලංකාවේ රැඳී සිටින ඉන්දියානු හමුදාව පිළිබඳව. මැතිවරණ කාලයේ දී මේ කාරණය මුළු මහත් ජනතාවගේ ම අවධානයට ඉතා දැඩි ලෙස යොමු වුන බව තමුන්නාන්සේලා දන්නවා. නොයෙකුත් විවේචන තිබුණා. පිටරටක හමුදාව ලංකාවට ගෙනල්ල උතුරු නැගෙනහිර පලාත් භාරදීල තිබෙනවා ය, මේ හමුදාව යයි ද, සදහටම ඉඳී ද කියන සැකය රැව් පිළිරැව් දුන්න. ඒ වේලාවේ තමුන්නාන්සේලා දන්නවා මම ජනාධිපති අපේක්ෂකයා හැටියට අපේ මැතිවරණ ප්‍රකාශනයේ ජනතාව ඉදිරියේ තැබූ ආකල්පය. අපි කිව්වෙ අපට බලය ලැබුණොත් ඉන්දියාව සමග අපි ඇති කර ගන්නෙ මිත්‍ර ගිවිසුමක්. මොන විදිහේ මිත්‍ර ගිවිසුමක් ද? අපෙන් යමක් කෙරෙනවා නම් ඒ හා සමාන දෙයක් ඉන්දියාවෙනුත් කෙරෙන්න ඕන. ඉන්දියාවෙනුත් යමක් කෙරෙනවා නම්, අපිත් ඒ හා සමාන දෙයක් කරන්න ඕන. සම තත්ත්වයේ ඉඳගෙන හුවමාරු සහගත මිත්‍රත්ව ගිවිසුමක්. එවැනි ගිවිසුමක් ඉන්දියාවත් සෝවියට් දේශයත් අතර තිබෙනව. දෙරටේම ස්වෛරීත්වය, ස්වාධීනත්වය, ආරක්ෂාව ඇති ගිවිසුමක්. අන්න එවැනි ගිවිසුමක් අනුව අපිත් මිත්‍රත්ව ගිවිසුමකු ඇතිකර ගන්නව.

ඊළඟ කාරණය නම් අපේ පක්ෂයේ අපේක්ෂකයා හැටියට පත්වෙන අවස්ථාවේ දී ඉන්දියානු හමුදාව මේ රටේ රැඳී සිටියහොත් ඔවුන් පිටත් කර හැරීමට ක්‍රියා කිරීම. එයින් බලාපොරොත්තු වූයේ අපේ පක්ෂයේ අපේක්ෂකයා පත්වෙන්නටත් ඉස්සරවෙලා මේ හමුදාව යයි කියන එක. නමුත් මම පත්වුනාම මම දිව්රුම් දෙන්නත් ඉස්සරවෙලා ඉන්දියානු හමුදාව ඉන්දියානු රටට ගෙන්වා ගැනීමට ඉන්දියානු රජය ක්‍රියාකරගෙන යන බව මට ඉන්දියානු රටේ තානාපතිතුමා ඇවිත් සඳහන් කලා. ඒ අනුව හමුදා හටයින් දහස්

ගණනක් ඒ රටට ගෙන යාමට ක්‍රියා ආරම්භ කළා. මම ඒ ගැන ඉතාමත්ම ස්තූතිවන්ත වෙනව.

මම පත්වෙලා ජූලි මාසෙ 02 දාට 6 මාසයක් සම්පූර්ණ වෙනව. කවදාද මේ ඉන්දියානු හමුදාව යවන්නේ කියන එක ගැන මගෙන් නොයෙක් අය ප්‍රශ්න කරන නිසා, ගිය ජූනි මාසෙ 01 වැනිදා මම ප්‍රකාශයක් කරල කිව්ව. ඒ හමුදාව පිටත්කර හැරීමේ වැඩපිළිවෙල ආරම්භ වෙලා තිබෙනවා, කියන්නටත් ඉස්සරවෙලා. ඒ ගැන සතුටුවෙන්නට ඕන. ජූලි මාසෙ අවසාන වන කොට මේ හමුදා භටයන් ඇවිල්ල අවුරුදු දෙකක් සම්පූර්ණ වෙනව. ඒ නිසා මේ හමුදාව ගෙන්වා ගැනීමට ක්‍රියා කරන්න. පුළුවන් තරම් උත්සාහ කරන්න මේ මුළු හමුදාවම ගෙන්වා ගන්න. ජූලි මාසෙ අවසාන වෙන කොට. මම කැමතියි ඉන්දියානු හමුදා අවසාන භටයා ජූලි මාසෙ අවසාන වෙන්න ඉස්සරවෙලා මෙරටින් පිටවෙලා යනවා දකින්න. දැන් ඒ අනුව එතුමාට ලියල ඇරිය. මේ තත්ත්වය ගැන ඇතිවෙච්ච අදහස් හුවමාරු ඉන්දියාවත් අපේ රටත් අතර හොඳටම දන්නව. තමුන්නාන්සේලාට ඒ පිළිබඳව අපේ ජන සන්නිවේදන මාධ්‍යයෙන්, ජන සන්නිවේදන මාධ්‍යයේ ප්‍රවෘත්ති පත්‍ර මාර්ගයෙන්, ගුවන් විදුලිය මාර්ගයෙන්, රූපවාහිනිය මාර්ගයෙන් හුඟාක් තොරතුරු මේ පහුගිය දවස්වල දැන කියාගන්න ලැබුණා. ඒ නිසා ඒ ගැන විස්තර අමුතුවෙන් කියන්න යන්නෙ නැ. දැනට තිබෙන තත්ත්වය ගැන පමණක් කාරණා කීපයක් සදහන් කරන්න කැමතියි.

තමුන්නාන්සේලා දන්නව ඉන්දියානු හමුදාවට ඉවත් වෙලා යන්නට යි කියල මම කරපු දැන්වීම නියමය මගේ තනි තීරණයක් නොවන බව. තමුන්නාන්සේලා දන්නවා ජනාධිපතිවරණයේදීත්, මහා මැතිවරණයේදීත්, ජනතාව ඡන්දය දීපු ආකාරය විග්‍රහ කරල බලන කොට මේ ඉන්දියානු හමුදාව ඉවත් වී යා යුතුයයි කියන එක අපේ ජනතාවගෙන් 95% කගේ නියමයක් ය කියල මම ප්‍රකාශ කරන්න කැමතියි. මගේ තනි තීරණයක් නොවෙයි. මේ රටේ ජනතාවගේ තීරණයක්. රටේ ඉන්න ස්වෛරී ස්වාධීන ජනතාවගේ තීරණයක්. මම කරන්නේ සහෝදර සහෝදරියනි, ඒ නියමය ක්‍රියාත්මක කිරීමයි. මම බැඳිල ඉන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට, මම දිවුරල තිබෙන්නෙ, එදා දළදා මාළිගාවෙ පත්තිරිප්පුවෙ ඉදගෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තිසි විදියට ක්‍රියාත්මක කරනව යි කියල මම දිවුරලා පොරොන්දු වෙලා තිබෙනව. ඒ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙ ඉතාමත්ම වැදගත් ප්‍රතිඥාව තමයි රටේ ස්වෛරීත්වය, ස්වාධීනත්වය, ඒකීය භාවය ආරක්ෂා කිරීම මම කරන කියන හැම කාර්යයක දී ම මම නිතරම මතක තබා ගත

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය

සුතු දෙයක්, මොන සාකච්ඡාවක් කළත්, මොන වැඩ පිළිවෙළක් ආරම්භ කළත්, අපේ ඒ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඒ ප්‍රතිපත්තියට බැඳී සිටිමු. ඒක වෙනස් කරන්න ඒකච්ඡන්දයෙන්වත් පාර්ලිමේන්තුවට පුළුවන්කමක් නෑ. ඒ කරන්න පුළුවන් වෙන්නේ ජනතාවට පමණයි. ඒ නිසා මම ඊට බැඳී සිටිනවා.

ඊළඟට මැතිවරණයේ දී අපි ඉදිරිපත් කරන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්න මම බැඳිල ඉන්නවා. ඒ ජනතාව කළ නියමයක්. ඒකයි මම ක්‍රියාත්මක කරන්නෙ. ඒ නියමයට විරුද්ධවීම මට පෞද්ගලිකව විරුද්ධවීමක් නොවෙයි. තමුන්නාන්සේලා දන්නවා ඒ මගේ පුද්ගලික තීරණයක් නොවන නිසා.

ශ්‍රී ලංකාවටත්, ශ්‍රී ලංකාවාසී ජනතාවටත්, කරන ද්‍රෝහීකමක් මේ නියමයට විරුද්ධව යම් කෙනෙක් කතා කිරීම හෝ ක්‍රියා කිරීම. ශ්‍රී ලංකාවේ ස්වෛරීත්වය බාල්දු කිරීමක්. ජනතාවගේ නියමය අපි ක්‍රියාත්මක කරමු.

ඉන්දියානු රජයේ පිළිවෙත කුමක් වුවත්, මම එකක් කියන්න ඕන තමුන්නාන්සේලාට. ඉන්දියානු ජනතාවත්, ඉන්දියාවේ බුද්ධිමතුනුත්, ඉන්දියාවේ ජන සන්නිවේදන මාධ්‍යයත්, අද ඉතා දැඩි ලෙස ශ්‍රී ලංකාවේ ස්වෛරීත්වය රැකීමට තම් තම හඬ නගන බව අපි කවදාවත් අමතක කරන්න නරකයි. අපේ ගෞරවය අපේ ඉන්දියානු සහෝදර ජනතාවට අපි පිරිනැමිය යුතුයි. ඉන්දියාවේ ජන සන්නිවේදන මාධ්‍ය — බුද්ධිමතුන් හැම දෙනාම කියන එකක්, එක හඬින්, බොහෝ සුළුදෙනෙක් ඇරෙන්න, ඉන්දියානු රජයේ උදවිය ඇරෙන්න මුළු මහත් ඉන්දියාවම එක හඬින් කියන එකක්, බොහොම වැරදි වැඩක්, ලංකාවේ අකමැත්ත උඩ අපේ හමුදාවක් ලංකාවේ තබාගෙන තිබීම සම්පූර්ණයෙන්ම අසාධාරණයක්. නීති විරෝධී ක්‍රියාවක් කියන එක අද ඉන්දියාවේ රැව් පිළිරැව් දෙන බව මම ප්‍රකාශ කරන්න කැමතියි. ඒ නිසා ඒ ඉන්දියාවේ ජනසන්නිවේදන මාධ්‍යයට, ඉන්දියාවේ බුද්ධිමතුන්ට ඉන්දියාවේ දේශපාලනඥයින්ට ඉන්දියාවේ ජනතාවට අපේ ගෞරවය පිරිනමන්නට ඕනෙ. මේ ඉන්දියානු හමුදාව ඉවත් කරන්නට කීම ඉන්දියාවට විරුද්ධව ගන්න පියවරක් නොවෙයි. ඉන්දියාවේ ගෞරවණීය නාමයට කරන උපහාරයක්. මේ ඉන්දියානු හමුදාව බලහත්කාරයෙන් මෙහි රැඳී සිටියහොත් අපෙන් අවසරයක් නැතිව, ඉන්දියාවට විශාල අපකීර්තියකට - නින්දාවකට පත් වෙන්න සිද්ධ වෙනවා.

බුදුරජාණන් වහන්සේ ඉපදුනෙ ඉන්දියාවේ. ධර්මාශෝක රජතුමා පහළ උනේ ඉන්දියාවේ. මහත්මා ගාන්ධිතුමා ජීවත් උනේ

ඉන්දියාවේ. එවැනි අපකීර්තියක් ලැබෙනවාට අප කිසිසේත් කැමති නැති බව මම ප්‍රකාශ කරන්න කැමතියි. ඒ නිසයි, ඉන්දියානු ජන සන්නිවේදන මාධ්‍යයත්, බුද්ධිමතුනුත්, ජනතාවත් හඬ නගා කියන්නෙ. ඒ පිළිබඳව ඉන්දියාවෙ විරෝධය නැගෙනවා. ඉතා එට්නා ඉල්ලීම් පළවෙනව පුවත්පත්වල. ඒ වගේම ලෝකයේ නොයෙක් රටවල්වල පළවෙන පුවත්පත්වල මේ වැඩපිළිවෙලේ තිබෙන අසාධාරණත්වය හඬ නගා කියනවා. ඒ හැම දෙනාට අපි කෘතඥ වෙනව. ඒ කවුරුත් ශ්‍රී ලංකාවේ ස්වෛරීත්වය රැකීමට තමන්ගේ හඬ නගනව. ඒ සාධාරණ ජනතාව අපේ කෘතඥතාවයට ගෞරවයට පාත්‍ර වෙනව.

ඉන්දියානු හමුදාව ඉවත් කර ගන්නට කීමෙන් අපි මොකක් ද කරන්නෙ? අපි කරන්නෙ ඉන්දියාව කැපවෙලා ඉන්නව යි කියන, ඉන්දියාව බැඳිල ඉන්නව යි කියන, ඉන්දියාව පිළිපදිනව යි කියන, නොබැඳි පිළිවෙත - පංචශීල ප්‍රතිපත්තිය ආරක්‍ෂා කිරීම, ආරක්‍ෂා කර ගැනීමට අපි කරන්නේ උපකාරයක්. මම මේ ස්වෛරී, ස්වාධීන ශ්‍රී ලංකාවෙන් අවසරය නැතිව ඉන්දියානු හමුදාව මේ රටේ බලහත්කාරයෙන් රැඳී සිටීම ඒ පංචශීල ප්‍රතිපත්තියට - නොබැඳි පිළිවෙතට ඉදුරාම විරුද්ධ බව තමුන්නාන්සේලාට කියන්න කැමතියි. ඒ නිසා අපි ඒ අතින් කරන්නේ ඉන්දියාවට උපකාරයක්. ඉන්දියාවේ කීර්ති නාමය ආරක්‍ෂා කර ගැනීමට.

තමුන්නාන්සේලා දන්නව රටක ඒකඝත්වය, ඒ රටේ අවසරය නැතිව ඒ රටේ අභ්‍යන්තර පාලනයට බලහත්කාරයෙන් අත පෙවීම, ඒ රටේ රැඳී සිටීම, පංචශීල ප්‍රතිපත්තිය බිඳ වැටීමක්. කවුද මේ පංචශීල ප්‍රතිපත්තියේ ප්‍රධාන නිර්මාතෘවරයා. ඉන්දියාවේ ප්‍රථම අග්‍රාමාත්‍ය දිවංගත පණ්ඩිත ශ්‍රී ජවහර්ලාල් නේරු මැතිතුමා. එතුමා තමයි, පංචශීල ප්‍රතිපත්තිය සකස්විය යුතු යයි කීමේ පුරෝගාමියෙකු හැටියට ක්‍රියාකළේ. ඒ ප්‍රතිපත්තියෙ පැහැදිළිවම තිබෙනව ස්වෛරී රටක අකමැත්ත උඩ ඒ වැඩකටයුතුවලට අත පෙවීම සම්පූර්ණයෙන්ම වැරදියි කියල.

ඒ ශ්‍රේෂ්ඨ ජනනායකයා සිහිකරන, නේරු තුමා සිහිකරන ශත සංවත්සරය, මේ අවුරුද්ද. අද ඉන්දියානු ජනතාව සූදානම් වෙනව ශ්‍රී නේරුතුමාගේ ශත සංවත්සරය සිහිපත් කරන්න. ඒ ශත සංවත්සරය සිහිපත් කරන අවුරුද්ද. එතකොට සහෝදර සහෝදරියනි, මෙවැනි අනුස්මරණීය අවුරුද්දක පණ්ඩිත ශ්‍රී ජවහර්ලාල් නේරු අගමැතිතුමා පෙනී සිටි ප්‍රතිපත්ති මරා දැමීම එතුමා සිහිකිරීමක් ද කියලයි මම අහන්නෙ?

ඉන්දියානු රජයේ අවංකභාවය ඔප්පු කිරීමෙන් අපේ රටේ ස්වෛරීත්වය රකින්න ඉන්දියානු රජය සූදානම් ය කිය කියා හැමවිටම කියනවා. එහි අවංක භාවය ඔප්පු කිරීමට දැන් කදිම අවස්ථාවක් ඉන්දියාවට ලබා දීල තිබෙනව. මේ ඉන්දියානු හමුදාව ඉවත්කර ගන්න ය කියල කීමෙන් අපි ඉන්දියාවට හොඳ අවස්ථාවක් ලබාදීල තිබෙනවා. ඉන්දියාව ශ්‍රී ලංකාවේ ස්වෛරීත්වය පිළිගන්නව ය. අගය කරනව ය, ආරක්ෂා කරනව ය කියන එක ඔප්පු කරන්න. මම විශ්වාස කරනව මේ අවස්ථාවෙන් ප්‍රයෝජන අරගෙන ඉන්දියාවෙ කීර්තිය තවත් වැඩි කරගනීවි ය කියල.

ඉන්දු - ශ්‍රී ලංකා ගිවිසුම අත්සන් කරන්න ඉන්දියාව අපට බලපෑපු හැටි මම අමුතුවෙන් කියන්න ඕන නැහැ. උතුරු නැගෙනහිර ජනතාව ආරක්ෂා කරන්න කියලයි ඒ ගිවිසුම අත්සන් කරන්න එදා ඉදිරිපත් උනෙත්, උතුරු නැගෙනහිර ප්‍රදේශවල සාමය සඳහා ය කියලයි අපේ ජනාධිපතිතුමාගේ ආරාධනය, ඉල්ලීම උඩ ඉන්දියානු හමුදාව මෙහාට එව්වෙ. ඒ වෙලාවෙ කිව්ව, ලංකාවේ ජනාධිපතිතුමා කියපු නිසා අපි ආවා. ලංකාවේ ජනාධිපතිතුමා කියන ඕනෑම වේලාවක අපි යන්න ලෑස්තියි කියා. දැන් ඒ කියමන ඔප්පු කරන්න අවස්ථාව එළඹිලා තිබෙනවා. එහෙමනම් මමත් අහන්න කැමතියි ඇයි මේ කාර්යය කරන්න ප්‍රමාද වෙන්නෙ කියල?

තමුන්නාන්සේලා දන්නව ඇල්. ටී. ටී. ඊ. කණ්ඩායම මෙල්ල කර ගැනීමට ඉන්දියාවට බැරි උනා, මේ පහුගිය අවුරුදු දෙකේ දී. මහා ප්‍රබල ඉන්දියානු හමුදාවට බැරිඋනා. අද අපත් සමග සාකච්ඡා කිරීමෙන් පස්සේ ඇල්. ටී. ටී. ඊ. කණ්ඩායම කියනවා අපි එදිරිවාදුකම් ඔක්කොම අතහරිනවා. අපි සාමයට කැමතියි. උතුරු - නැගෙනහිර ජනකොටස්වලට පමණක් නොව, මුළු ලංකාවේම ජනතාව සමග, රජය සමග මීට පස්සේ අපේ කිසිම එදිරිවාදුකමක් නෑ. ඉන්දියානු හමුදාවලටත් අපි ලෑස්තියි, අපේ තියෙන එදිරිවාදුකම් ඉවත් කර ගන්න, අපටත් ඒ විදිහට සළකනවා නම්. එහෙම කියද්දිත්, මේ ඉන්දියානු හමුදාව දැන් අපිත් එක්ක සාකච්ඡාවට ඇවිත් තියෙන ඇල්. ටී. ටී. ඊ. කණ්ඩායමට දරුණු ලෙස පහර දෙන්න පටන් අරන්. දැන් ලංකාවේ ජනාධිපතිතුමාගේ අණසක යටතේ ක්‍රියාකරනව යි කියලයි එදා අපට කිව්වෙ, මම දැන් කියල තියෙනව ඒ පහරදීම් නවත්වන්නට යි කියල.

එතකොට එදා කියපු දෙයක් බිඳ වැටීගෙන යනව යි කියල මට කණගාටුවෙන් කියන්න සිද්ධ වෙනව. මම අහන්න කැමතියි, සාමය ඇති කරන්නෙ, සාමයට සූදානම් කියන කොටස් විනාශ කිරීමෙන් ද

කියලා. අවුරුදු දෙකක් අවි මගින් මෙල්ල කරන්න බැරි වූ කණ්ඩායම සාකච්ඡාවෙන් සාමකාමී කර ගැනීම ගැන ඇයි කවුරුවත් අම්නාප වෙන්නෙ. ඇල්. ටී. ටී. කණ්ඩායම පෙන්න පෙන්න සඳහටම ලංකාවේ රැඳී සිටීමට ඉන්දියානු හමුදාවට තිබුණු බලාපොරොත්තුව කඩ උණා කියන ස්ථාවරය නේද එයින් හෙළි කරන්නෙ? මේ ප්‍රශ්ණෙ දැන් කවුරුත් දන්නව. අවුරුදු දෙකක් ඇල්. ටී. ටී. ඊ. කණ්ඩායම මෙල්ල කර ගන්න බැරි උනා නම්, බොහෝ දෙනෙක් කියනව මෙල්ල කළේ නැහැ කියල ඕනෙ කමින්, ඇල්. ටී. ටී. ඊ. කාරයින් මෙල්ලකරගෙන මේ රටේ ඉන්න යී බලාපොරොත්තුව තිබුණෙ කියා, චෝදනාව දැන් නගනව. ඇල්. ටී. ටී. ඊ. කණ්ඩායම ශ්‍රී ලංකා රජයත් සමග සාමකාමී වාතාවරණයකට ආවාම ඇල්. ටී. ටී. ඊ. කණ්ඩායමට මෙහෙම පහර පිට පහර දෙයි. අප ස්ථාවරය ඒ ගොල්ලන්ගෙන් බිඳ වැටෙයි, කියන නිසා නේද ප්‍රශ්ණ නගනව.

මා ඡන්දයෙන් පත්වුණු වහාම කලින් කිව්ව වගේ දිවුරුම් දීමටත් පෙර හමුදාව ඉවත් කිරීම ආරම්භ කළේ ඉන්දියානු රජය. තමන්ගේම වැඩපිළිවෙල. එහෙම නම් ඒ ඉවත් කර ගැනීම තවත් ඉක්මන් කරන්න යී කියල මම කිව්වම, මම තනියෙන් කරපු තීරණයක් ය කියල අපට චෝදනා කිරීම හරිද කියල මම අහන්න කැමතියි.

ඉන්දිය හමුදාව ඉවත්කර ගන්නේ පළාත් සභා බලතල ඔක්කොම දුන්නාට පස්සේ, දෙමළ ජනතාවගේ පූර්ණ ආරක්ෂාව ඇති උනාට පස්සේ, ආදී කොන්දේසි දැන් ඉදිරිපත් කරනවා. නමුත් මා පත් වූ වහාම ඉන්දිය හමුදාව ඉවත් කර ගන්නවා කියපු වෙලාවේ ඒ එක කොන්දේසියක් වත් ඉදිරිපත් කළේ නැහැ. ඒ ඇයි? එහෙම කළේ ඇල්. ටී. ටී. ඊ. එක කවදාවත් ශ්‍රී ලංකාවේ රජය සමග සාමයක් ඇති කර ගනීවිය යී නොසිතූ නිසා නේද?

අවුරුදු දෙකක් තිබුණා එල්. ටී. ටී. ඊ. කණ්ඩායම ඕනෑ නම් සාම මගට ගෙන එන්නට. බලතල බෙදාදීම දිගටම ක්‍රියාත්මක විය යුතු ක්‍රියාවලියක්. එතෙක් යන්නේ නැහැ කීම සඳහටම ඉන්නවා කියන එක ද කියා සිටින්නේ? රටක හිංසාකාරී ක්‍රියා මුළුමනින්ම නතරවනතුරු යන්නේ නැහැ කියන්නේ සඳහටම යන්නේ නැහැ කියන එක නේද? කොයි රටේ ද අපරාධ හිංසා මුළුමනින්ම නතර වී තියෙන්නේ? ඉන්දියාවේ ඒ තත්ත්වය තියෙනවාද? ඉන්දියාවේ හැමදාම අපරාධ හිංසා සිදුවෙන්නේ නැද්ද? බෝම්බ ගහන්නේ නැද්ද? මිනී මරන්නේ නැද්ද? එහෙනම් ඉන්දියාව තුළත් හැමදාම පිටරටක හමුදාවක් සිටිය යුතු නේද? ඉන්දිරා ගාන්ධි අගමැතිණියගේ වට්නා

ජීවිතය, ඉන්දියානු ආරක්ෂක හමුදාව ආරක්ෂා කරද්දිම විනාශ වූයේ වෙන රටක හමුදාවක් ඉන්දියාවේ අරක්ගෙන නොසිටි නිසා ද? මේවා ජනතාව නගන ප්‍රශ්න. ඉන්දියාවේ සාධාරණ ජනතාවත් මේ ප්‍රශ්න මතු කරනව.

මම කියන්න කැමතියි ඉන්දියාවට හොඳ ඉතිහාසයක් තියෙනවා. තමන්ගේ රටක හමුදාව වෙනත් රටවල් වලට ඇරපු අවස්ථාවල් වලදී ක්‍රියාකරපු ආකාරය ගැන. මට ඒ පිළිබඳව ඉතා වටිනා ලියවිල්ලක් ඉන්දියානු ජාතික කීර්තිමත් ලේඛකයෙක්, ඉන්දුස්ථාන ටයිම්ස් පත්‍රයට ලියල තියෙනව. ඒකෙන් පෙන්නල දීල තියෙනව ඉන්දියාව කරුණාකරල මතක තියාගන්න ඉන්දියාව වෙන රටකට හමුදා ඇරීම පිළිබඳව ඉතිහාසයේ ඉතා වැදගත් අංගයක් තියෙනවා ය, කියා. ඒ හමුදාව ඉවත් කර ගත්තා ය, සමහර අවස්ථාවල්වල ඒ රටේම අය තවත් රැඳී ඉන්නා ලෙස කියද්දිත් ඉන්දියාව තම හමුදා ඉවත්කරගෙන තිබෙන බව ද මේ ලියවිල්ලේ පෙන්වා දී තිබෙනවා.

වෙනත් මහා රටවල් එවැනි උසස් ආදර්ශ දීල තියෙනව. තමන්ගේ යුද්ධ හමුදාව ඕනෑවට වැඩි කලක් විදේශ රටවල තබා ගැනීමෙන් වැලකීමේ ප්‍රෞඪ ඉතිහාසයක් ලෝක වාර්තාවක් ඉන්දියාවට තිබෙනවා.

ඒ අවස්ථාවන් කීපයක් මම තමුන්නාන්සේලා ඉදිරිපත් කරන්න කැමතියි. මේ අතින් 1972 දී ඉන්දිරා ගාන්ධි මැතිණියගෙන් කදිම උදාහරණයක් ලෝකයට යොමු උණා. ඒ වර්ෂයේ දී ඉන්දිරා ගාන්ධි මැතිණිය ඒකපාක්ෂිකවම තමන්ගේ ගැලවීමට තීරණය කරල තමන්ගේ හමුදාවක් බංගලිදේශයෙන් සම්පූර්ණයෙන්ම ආපහු කැඳවා ගත්තා. ඒ වේලාවේ ඒ ක්‍රියාව කරද්දී බංගලි.දේශයේ නායක ෂීඛ් මුජිබල් රහුමාන් මැතිතුමා ඒ හමුදාව තව ටික කලක් තමන්ගේ රටේ රඳවන්නට යි කියල ඉල්ලද්දිත්, ඒ ඉන්දියානු හමුදාව ඉවත් කර ගත්ත බංගලි දේශයෙන්. මේ ක්‍රියාවෙන් ලෝකය මවිතයට පත් උනා. රජීව් ගාන්ධි මැතිතුමාත් මේ අළුත මාලදිවයිනට හමුදා යැවූ බවත් තමුන්නාන්සේලා දන්නව. ඒ හමුදාව යවපු කාලය අවසන් වෙච්ච හැටියේම ඒ හමුදාවෙන් වැඩි කොටසක් ඉවත් කර ගත්ත. බොහොම ටික දෙනෙක් පමණයි රැඳී සිටියේ.

ජාත්‍යන්තර වශයෙන් බැලුවාම සෑම රටකින්ම විදේශීය හමුදා හැකිතරම් ඉක්මණින් ඉවත් කර ගත යුතුය කියන ප්‍රතිපත්තිය ඉන්දියාව හැම වේලාවේම ස්ථිරවම උදව් කරල තියෙනව ගරු කරල තියෙනවා. ඒ ප්‍රතිපත්තිය පිළි අරගෙන, විදේශීය හමුදාවක් යම් රටක නවත්වන්න ලැබිච්ච වරම ඉකුත් උනාම ඒ කියන්නේ ඒ

හමුදාව පිළිගත්ත රටේ කැමැත්ත අවසන් උනාම, හමුදාව එවපු රට තම හමුදාව වහාම කැඳවා ගත යුතුය කියන ප්‍රතිපත්තිය ඉන්දියාව සෑම විටම අවලංගුව පිළිගත්තා.

නමුත්තාන්සේලාට මතක ඇති රුසියන් හමුදා 1972 දී ඊජිප්තුවෙන් කැඳවා ගත් හැටි. අභාවප්‍රාප්ත අන්වර් සදාත් මැතිතුමා ඒ හමුදා ඉවත්කර ගන්නය කියා කිව්වාම සෝවියට් දේශය තමන්ගේ හමුදා සම්පූර්ණයෙන්ම ආපසු කැඳවා ගත්තා. වර්ෂ 1960 ගණන්වල ඉඳලාම ඊජිප්තුවට ප්‍රධාන වශයෙන් ආරක්ෂාව සැපයුවේ සෝවියට් දේශයයි. කයිරෝවේ ආණ්ඩුවත් සෝවියට් දේශයත් අතර ඊජිප්තුවේ සෝවියට් හමුදා නවතා තැබීම ගැන විවෘත ගිවිසුම් මෙන්ම රහස් ගිවිසුමුත් තිබුණා. නමුත්, සෝවියට් හමුදා භටයින් සියළු දෙනාම ඉවත්කර ගන්නය කියා සදාත් බ්‍රෙෂ්නෙප්ගෙන් ඉල්ලා සිටියාම සෝවියට් නායකයාට ඊට එකඟ නොවී බැරිවුණා. ඊට පස්සේ සතියක් යනකොට එක සෝවියට් සොල්දාදුවෙක්වත් ඊජිප්තුවේ සිටියේ නැහැ.

ඉන්දියානු හමුදාව ආපු වෙලාවේ තිබේ ලංකාවේ ප්‍රධාන හමුදා අණදෙන නිලධාරී ලංකාවේ ජනාධිපතිතුමාගේ අණසක යටතේ ඉන්දිය හමුදාව ක්‍රියාකරන බව නේද? දැන් ඒ අණ භාර නොගෙන බලහත්කාරයෙන් - සිටිනවා නම් එයින් මතුකොට පෙන්වන්නේ කුමක්ද? ඉන්දියානු හමුදාව ගෙනාවේ යත්ට නොව, සදහටම ලංකාවේ රැඳී සිටීමට බව ඔප්පු කිරීම නේද? උතුරු - නැගෙනහිර සාමය සඳහා මම උත්සාහ කරන්නේ ප්‍රථමයෙන් එල්. ටී. ටී. ඊ. කණ්ඩායම සමග සාකච්ඡා කරමින්, ඔවුන් ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියා පිළිවෙතට යොමුකර ගැනීමටයි. එය හුඟක් දුරට සාර්ථක වී තිබෙනවා. දැනටමත් ප්‍රජාතන්ත්‍රවාදී මගට යොමු වී සිටින, ඊ. පී. ආර්. එල්. එෆ්., ටී. යූ. එල්. එෆ්., ඊරෝස්, ටෙලෝ, ප්ලොට් ආදී අනිකුත් හැම කණ්ඩායමක් සමග ද අවබෝධය තව තවත් වැඩි දියුණු කරගන්නවා. සාකච්ඡා කරනවා. ඒ සඳහා අපේ වැඩ පිළිවෙලක් - කාල සටහනක් තියෙනවා. ඒ විතරක් නොවේ. අනිකුත් සියළුම දේශපාලන පක්ෂ ද මේ ක්‍රියාදාමයට එකතු කරගන්නවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, මහජන එක්සත් පෙරමුණ, එක්සත් සමාජවාදී පෙරමුණ, ලංකා සමසමාජ පක්ෂය, ශ්‍රී ලංකා කොමියුනිට් පක්ෂය, මුස්ලිම් කොන්ග්‍රසය, ලංකා වතුකම්කරු සංගමය, ප්‍රජාතන්ත්‍රවාදී වතුකම්කරු සංගමය, මුස්ලිම් මහාසභාව, ලිබරල් පක්ෂය, එක්සත් ලංකා ජනතා පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ ආදී ලියාපදිංචි හැම පක්ෂයක්ම මේ වැඩ පිළිවෙලට එකතු කර ගන්නවා.

සියළු පක්ෂවල නම් නොකියවුනා නම් එයින් හැඟෙන්නේ ඒ අය අයින් කිරීමක් නොවේ. හැම ජන කොටසක්ම හැම ආගමික කොටසක්ම මේ මහා සාමකාමී වැඩ පිළිවෙලට හවුල් කරගන්නවා. අද තියෙන තත්ත්වයේ හැටියට ඒ ඒ කොටස් නියෝජනය කෙරෙන ද්‍රවිඩ නායකයින් මරා දැමීම නිසා පාඩු වන්නේ රජය ගෙන යන සාම සාකච්ඡාවලට නේද? කවුද මේවා කරන්නේ? කවුද මේවා කරවන්නේ ? ඒ ගැන ගැඹුරටම සෙවිය යුතුයි. මේ ඝාතන නිසා කාටද අවාසි? ඉන්දීය හමුදාව යැවීමට ක්‍රියාකරන රජයට ද? ඉන්දීය හමුදාව සදහටම තියා ගැනීමට ක්‍රියාකරන අයටද? කල්පනා කර බලන්න. ශ්‍රී ලංකා රජයේ අවසරය නැතිව බලහත්කාරයෙන් යම් හමුදාවක් රැඳී සිටියහොත් එය ඒ රට ආක්‍රමණය කොට බලහත්කාරයෙන් ඒ රටේ රැඳී සිටීමක් නේද? එවැනි තත්ත්වයකට පත්වීමට ඉන්දියාව යොමු වෙතැයි මට හිතන්නටත් අමාරුයි. විශේෂයෙන් ම මේ ශ්‍රී නේරු ජයන්ති වර්ෂයේ දී එවැනි තත්ත්වයකට ඉන්දියාව පත්කර ගැනීමට ඉන්දීය රජය කල්පනා නොකළ යුතු යි.

ඉන්දීය හමුදාව ශ්‍රී ලංකාවේ ඉන්නතාක් කල් ශ්‍රී ලංකාවේ අණසක යටතේ සිටින බව එදා - 1987 දී කියපු ප්‍රකාශය ඇයි අද ක්‍රියාවෙන් අනුමත කරන්නට බැරි? ඇයි පසුගිය ජනවාරි/ පෙබරවාරි කාලයෙන් පසු හමුදා ඉවත් කිරීම නතර කළේ? ඇයි එල්. ටී. ටී. ඊ. කණ්ඩායම අප සමග සාකච්ඡාවට ආ පසු ඔවුන්ට පැන පැන පහර දෙන්නේ? ඇයි බලහත්කාරයෙන් උතුරු නැගෙනහිර තරුණ තරුණියින් හමුදාමය ක්‍රියාදාමයකට යොදාගන්නේ? ඇයි ඒ අයට ගමරට අතහැර කොළඹට එන්ට සිදුවී ඇත්තේ? මේවා කවුරුත් අහන ප්‍රශ්න.

අද ලංකාවේ හැම පක්ෂයක්ම - හැම කණ්ඩායමක්ම සන්නද්ධ වී සිටිනවා. ඒ නිසා එක පක්ෂයකට එක කණ්ඩායමකට අවි බිම තබන්නට කීම යථාර්ථයට පිටු පෑමක්. දැන් අවශ්‍ය වී තිබෙන්නේ හැම පක්ෂයක්ම හැම කණ්ඩායමක්ම කතාබහ කොට නිරායුධවීමට ක්‍රියා කිරීමයි. එය කළ හැක්කේ හැම පක්ෂයක්ම හැම කණ්ඩායමක්ම තම තම දේශපාලන ප්‍රතිපත්ති පවා නොදී නිරායුධවීම, සාමකාමීවීම, සාකච්ඡාවෙන් අප අතර ඇති වැරදි වැටහීම් නිරාකරණය කර ගැනීමට අධිෂ්ඨාන කරගැනීමෙනුයි. ඒ අවස්ථාව සළසා දීමටයි මම උත්සාහ කරන්නේ. අප අතර ඇති මත භේදවලින් ප්‍රයෝජන ගැනීමට මාන බලන අතරමැදියන් ඊට බාධා කරන බව දැන් පැහැදිළිව පේනවා. අපව වඩ වඩාත් භේද කොට අපේ ස්වෛරීත්වය යටපත් කිරීමට කරන උත්සාහය ගැන හැමදෙනාම අවබෝධයක් ඇතිකර ගැනීමට කල්පනා කළ යුතු යි.

**Comments on the withdrawal of the Indian Peace Keeping Force made by His Excellency R. Premadasa, President in his address to the Executive Committee Meeting of the Colombo Central UNP Organisation held on 22nd July, 1989.**

Our election manifesto also makes reference to the existence of the Indian Peace Keeping Force on the soil of Sri Lanka. You know that during the election campaigns, this matter engaged the intense attention and concern of our people. Various charges were levelled against the rulers, in connection with the presence of the IPKF in our country. Some sections charged that the government had brought a foreign army into our country and handed over to them the administration of the North and East of the Island. They charged that this foreign army would not leave our country and it will remain forever. You know very well, the position I took, as the Presidential Candidate of the UNP, on this matter. I said, that after our victory, we would enter into an agreement with India, similar to the friendship treaty that exists between India and the Soviet Union, in place of the present Indo-Sri Lanka Agreement. You will note that, the salient feature of that Friendship Treaty is, reciprocity and it fully respects the sovereignty and independence of the countries that are parties to the treaty.

I also said that, if by the time we came into power, the Indian Peace Keeping Force happens to be still in Sri Lanka, we would take speedy action to send it back. That implied the hope that, the Indian Peace Keeping Force would have left Sri Lanka by the time we came into power and formed the government. Even without a formal request from us, the Indian Prime Minister was good enough, to withdraw a contingent of the IPKF. For that gesture, I expressed deep gratitude to the Indian Prime Minister.

On 2nd of July, I completed six months in the office of Presidency As many began to inquire from me, when the IPKF

would leave Sri Lanka, on June 1st I made an announcement to the country, that I would request the Indian Prime Minister, to withdraw the IPKF by the end of July. I pointed out that the IPKF would be completing two years in Sri Lanka by that time and requested that all efforts be made, to have that force withdrawn by the end of July. The country is now fully aware of the correspondence exchanged between me and the Indian Prime Minister Mr. Rajiv Gandhi on this matter. As such, I only wish to speak to you on the present situation regarding the matter.

Asking the Indian Army to withdraw from the country, is not a decision arrived at by me alone. It is a request for which a mandate has been given by 95 percent of the people of this country. What I am doing now is, implementing that mandate. Opposing such a move, is not something personally directed against me. It is an act of treachery, perpetrated on Sri Lanka and the people of Sri Lanka. It amounts to a devaluation of the sovereignty of the country.

Whatever stand the Indian Government takes, the people of India, the intellectuals of India and the Indian Media are raising a strong voice to help safeguard Sri Lanka's sovereignty. I wish to express my gratitude and appreciation to those fair minded people of India. By asking for the withdrawal of the Indian Army, we are helping India to safeguard the policy of Non-Alignment - the principle of Panchaseela - which India says she is following.

It is a violation of the principles of Panchaseela to interfere in the affairs of another country, without the consent of that country. India's first Prime Minister, the late Sri Jawaharlal Nehru, was the architect of the principle of Panchaseela. This year marks his 100th birth anniversary. Is it a fitting commemoration then, to destroy the very principles he stood for, in this year of commemoration? Does it not amount to forgetting him? We have given the Indian Government a fine opportunity to show her honesty.

Is it to safeguard the people of North and East, that the Indian Government compelled us to sign the Indo-Sri Lanka Accord? If so, why is it that attacks on the LTTE Group have been intensified, despite the LTTE announcing a ceasefire? Do we work to achieve peace, by destroying those who say they are ready for peace? Why entertain hard feelings, when a group which could not be controlled by use of arms for two years, had been veered towards

peace through consultations? Does this not reveal the position that the Indian Army's hopes of remaining in the country forever, by giving LTTE as the excuse, have been dashed?

Is it not unilaterally that the Indian Government decided, to withdraw the Indian Army, soon after I was elected and before I took oaths as President? Therefore, when I asked to expedite the withdrawal, is it correct to accuse me of taking a unilateral decision? Conditions are now being put forward, that the Indian Forces would be withdrawn, after devolution of powers to the Provincial Councils is completed and the security of Tamils is guaranteed. But, when I stated soon after I was elected, about getting the Indian Forces withdrawn, there were no such conditions men-tioned. Why was it? Is it not correct that this was done because it was never thought that the LTTE would come to peace with the Sri Lankan Government?

There was a period of two years, during which, the LTTE could have been brought into the peace process. The devolution of power is a continuing process. By saying that they would not go until devolution was done; does it mean that they would stay here forever? By saying that they would not go until violence in the country ceases; does it mean that they would not ever go?

In which country has crime and violence ceased completely? Is this the position in India today? Doest not crime and violence take place in India everyday? Were not bombs thrown? Are there no killings? If this is the case, should not a foreign army be stationed in India too forever? Is it because of the absence of a foreign army in India that the precious life of Mrs. Indira Gandhi was lost, while she was being guarded by India's own security force? These are the questions the people raise. These questions are also being raised by the fair and just minded people of India.

I wish to draw your attention to the fact that India has an excellent record of refraining from keeping her armed forces in other countries any longer than actually necessary under agreements. In this connection I would like to refer you to a comment made by a well known Indian writer in an article published in the Hindustan Times.

Following is in effect what he has stated in the article:

> "India has a proud record of not allowing her armies to stay for any longer periods than necessary in other countries. In 1972 Mrs. Indira Gandhi gave a fine example to the world. In that year Mrs. Indira Gandhi unilaterally decided to effect a complete withdrawal of her Army from Bangladesh. She did so despite a request made by the then President of Bangladesh Sheikh Mujibur Rahman to keep the Indian Forces for a few more days. The world was taken by surprise by this act. Mr. Rajiv Gandhi too reduced the presence of the Indian Forces to the barest minimum in the Maldive Islands after the realisation of the objectives for which the Army was sent there. Internationally too, India has always upheld the principle that foreign troops stationed in countries should be withdrawn as early as possible. India has specially contributed to the view that such foreign forces should be withdrawn forthwith, when the mandate for their stay expires. That mandate is nothing, but the consent of the country that invited them".

You will remember, how in 1972, Russian Forces were withdrawn from Egypt. When the late Anwar Sadat requested that Soviet Forces be Withdrawn, the Soviets withdrew them completely without any hesitation. Everybody knows that from the 1960s, Russia was the chief guarantor of the security of Egypt. There were agreements between Egypt and Soviet Russia, regarding the stationing of Russian troops in Egypt. While some of those agreements were open ones, others were secret ones. But when Sadat requested Brezhnev to withdraw all Russian troops, Soviet Russia could not but agree and act accordingly. Within just one week, all Russian troops were withdrawn from Egyptian soil.

When the IPKF came to Sri Lanka, didn't India say that her forces would be under the command of the President of Sri Lanka; the Supreme Commander of the Armed Forces of Sri Lanka? Now, if the IPKF disregards the command of that Supreme Commander, what does that indicate? Does not that show, that the Indian forces have come, not with the intention of going back, but with the hope of staying here forever? The first step of my approach to restore peace in the North and East, is to have a dialogue with the LTTE, in order to bring them over to the democratic process. This effort of mine, has now succeeded to a great

extent. I will also further broaden understanding with other groups such as EPRLF, TULF, EROS, TELO and PLOTE which have already opted to take the democratic path. We will have discussions with them too. We have a programme, a time-table for that. Not only that. We will draw in all other political parties too into this process. We will draw in the SLFP, MEP, USA, LSSP, CP, Muslim Congress, CWC, DWC, Muslin League, Liberal Party, ELJP, JVP and all other registered political parties to this process of dialogue and consultation.

If I have not mentioned the name of any political party or organisation, that does not mean, that, that party or organisation is left out. The participation of all communities and religious groups will be obtained for this peace process. In the present context, the assassination of Tamil leaders representing various sections of the Tamil people, will only prove an obstruction to the peace talks, that the government is carrying on today. Who is doing all this? Or who is getting these things done? We must go to the very bottom of these disruptive acts and expose the miscreants. Please consider who will be worst hit by violent acts — is it the people who try to perpetuate the presence of the Indian forces or the government which is trying to send back the Indian forces? If any foreign army stays on in Sri Lanka, without the permission of Sri Lanka and by force, does not that amount to an invasion of the country? I find it difficult to persuade myself to believe, that India will drag herself into such a predicament. Especially in this Sri Nehru Year, India should not get herself into such a position.

Why cannot India today live upto the declaration she made in 1987, that the IPKF, as long as it remains in Sri Lanka, will be under the command of the President of Sri Lanka? Why does she not prove her declaration with practical action today? Why did she stop withdrawing her forces from January/February this year? Why do they attack the LTTE with added enthusiasm, after the LTTE started talks with us? Why are young men and women in the North and East, drafted for military action by force? Why has it become necessary for them to flee from their homes to Colombo? These are questions that many people ask today.

In Sri Lanka today, every political party and group has found it necessary to arm itself. It is therefore, not realistic to ask any one political party or group to lay down arms. The

need now is for all political parties and groups,to talk in good faith and agree to disarm themselves voluntarily. That can be done,only through a process,where all organisations concerned, come forward to discuss peacefully and determine to iron out differences and restore peace without a surrender of good principles they uphold. I am trying my best to give that opportunity, to all sections concerned. I now clearly see,that some sections interested in intruding,are trying to obstruct this effort. All of us must be vigilant about this effort,to further exacerbate differences between us, destroy our sovereignty and make us lose our independence,which we have won at much cost.

ජනාධිපති ලේකම් කාර්යාලය
26 AUG 2023
පුස්තකාලය

Published by the Presidential Press Secretariat

